රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 03/92.

මගේ අංකය: ඩීඩී/1/92
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ.පෙ.අංක:500,
කොළඹ 1.
1992 ඔක්තෝබර් මස 22 දින.

සියලුම අමාත්‍යංශ ලේකම්වරුන් වෙත.

**රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලතල පැවරීම පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශය - ස්ථාන මාරු හා විනයානුකූල කටයුතු**

1992 පෙබරවාරි මස 26 වැනි දින අංක: ඊ.01/92 දරණ රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛයේ 3:4 හා 3:5 ඡේදවලට ඔබේ අවධානය යොමු කරවනු ලැබේ.

දැනටමත් ඔබ දන්නා පරිදි, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා ඊට උසස් නිලධාරීන් හැර, අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන්ගේ පත්කිරීම්, මාරුකිරීම්, සේවයෙන් පහකිරීම් හා විනයානුකූල පාලනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පැවරී තිබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව මාරුකිරීම් හා විනය පාලනය සම්බන්ධයෙන් ඊට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම පිණිස පහත සඳහන් උපදෙස් දෙනු ලැබේ:

2. <u>ස්ථාන මාරු - දිප ව්‍යාප්ත සේවාවන්</u>

2:1. කදිසි සේවා අවශ්‍යතා මත හෝ නිලධාරියකුගේ කදිසි අවශ්‍යතාවයකට ඉඩදීම පිණිස හෝ ස්ථානමාරු කිරීමක් අවශ්‍ය වන අවස්ථාවන් හැර අන් සෑම අවස්ථාවකම සාමාන්‍ය වශයෙන් ස්ථාන මාරුවක් කළ යුත්තේ මාරුකිරීම් පරිපාටියක් අනුව පමණි.

2:2 <u>මාරු මණ්ඩල.</u>

2:2:1. ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ 3 වගන්තියේ හා අංක: 19/92 දරන රා.පරි.චක්‍රලේඛයේ දක්වා ඇති අන්දමට දිප ව්‍යාප්ත සේවාවන් සඳහාද ස්ථාන මාරු මණ්ඩල පත් කළ යුතුය.

2:2:2. මෙම මාරු මණ්ඩල, ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ 3:8 වගන්තියේ හා අංක: 19/92 දරන රා.පරි.චක්‍රලේඛයේ 6 වැනි ඡේදයේ ප්‍රතිපාදන සැලකිල්ලට ගනිමින්, මාරුකිරීම් පරිපාටියක් සකස් කොට එය අදාල ලේකම්වරයාගේ නිර්දේශයක් සමග අනුමැතිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතුය.

/ 2...

2:2:3. අනුමත කරනු ලැබූ මාරුකිරීම් පරිපාටියට හිසි ප්‍රචාරයක් ලබාදීමෙන් පසුව අමාත්‍යංශ ලේකම්වරයා විසින් මාරුවීම් සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබිය යුතුය. එසේ ඉල්ලුම් කරනු ලැබූ අයදුම්පත් ඔහු විසින් ස්ථාන මාරු නිර්දේශ කිරීම සඳහා මාරු මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

2:2:4. මාරු මණ්ඩල විසින් නිර්දේශ කරන ලද නිලධාරීන්ගේ ස්ථාන මාරු අදාළ ලේකම් විසින් තම නිරීක්ෂණද සමඟ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

2:2:5. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත් පසුව, අදාළ ලේකම් විසින් තම අත්සනට ඉහළින් " රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි " යන්න සඳහන් කොට ස්ථාන මාරු නියෝග තම අත්සන යටතේ දක්වා හැරිය යුතුය.

2:2:6: 1. කෙසේ වුවද හදිසි සේවා අවශ්‍යතා මත යම් ස්ථාන මාරුවක් කළයුතු යයි තමා අදහස් කරන විටකදී, මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකුගේ ස්ථාන මාරුවක් ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩලයේ ඇමතිවරයකුගේ ලේකම්වරයකුට බලය පැවරේ.

2:2:6: 2. ඔහු විසින් එවැනි ස්ථාන මාරුවක් ක්‍රියාත්මක කිරීමෙන් පසුව, ඒ සඳහා හේතු වූ කරුණු දක්වමින් සතියක් ඇතුළත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතිය ලබා ගත යුතුය.

2:2:7. යම් ස්ථාන මාරු කිරීමේ නියෝගයකින් අතෘප්ත වූ නිලධාරියෙකුට, එම ස්ථාන-මාරු නියෝගය ලැබී සතියක් ඇතුළත අදාළ අමාත්‍යංශයේ ලේකම් මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය. අදාළ ලේකම් විසින් එවැනි අභියාචනා තමා වෙත ලද සැනෙකින් තම නිරීක්ෂණද සමග රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

2:3. මාරුකිරීම් පරිපාටියෙන් බැහැරව ස්ථාන මාරුවක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත නියෝග සඳහා නිර්දේශ කරන විටකදී, ඒ නිර්දේශය සඳහා හේතු වූ කරුණු දක්වමින්ද, අනුප්‍රාප්තිකයෙකු යෝජනා කරමින්ද, ස්ථාන මාරුව ක්‍රියාත්මක වන දිනය සඳහන් කරමින්ද නිලධාරියා දරන තනතුරින් මුදා හැරීමට අදාළ බලධාරීන් විසින් එකඟ වී ඇති බව සහතික කරමින්ද, අදාළ ලේකම් විසින් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. සුවිශේෂ කරුණු හේතු කොට ගෙන හදිසි සේවා අවශ්‍යතා මත කෙටි දැන්වීමකින් ස්ථාන මාරුවක් කළයුතු අවස්ථාවක හැර, අවම වශයෙන් එක් මාසයක් වත් කල් නොදී ස්ථාන මාරුවක් නියෝග කරනු නො ලැබේ.

/ 3...

3. <u>විනය කාර්ය පරිපාටිය.</u>

අංක: ඊ.01/92 දරන රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛයේ 3:5 ඡේදය යටතේ දැක්වෙන නියෝගයන් සම්බන්ධව පහත සඳහන් පැහැදිලිකිරීම් කරනු ලැබේ:

3:1. නිලධාරියෙකුට විරුද්ධව විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගැනීමට අදහස් කරන විටකදී, මූලික විමර්ශණ කටයුතු කරගෙන යාම හා ඒවා අවසන් කිරීම හැකි අවම ප්‍රමාදයකින් යුතුව කිරීම අමාත්‍යංශයේ ලේකම්වරයෙකු වෙත පැවරෙන කාර්යයක් වේ. නිලධාරියෙකු තමා දරන තනතුරේ කටයුතු තවදුරටත් කරගෙන යාම නුසුදුසු යයි අදහස් කරන විටකදී, ලේකම් විසින් වහාම ඔහුගේ වැඩ තහනම් කොට, එම වැඩ තහනමට හේතු වූ සියලුම කරුණු ඇතුළත් වාර්තාවක් වහාම ඉදිරිපත් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතිය ලබා ගත යුතුය.

3:2. සියලුම චෝදනාපත්‍ර කෙටුම්පත් මේ සමග ඇති <u>"ඒ" ආකෘති පත්‍රයට</u> සම්පූර්ණයෙන්ම අනුකූලව විය යුතු අතර, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන විට, ඒවා කෙටුම්පත් කළ මාණ්ඩලික නිලධාරියා විසින් ඒවායේ නිවැරදි හා ප්‍රමවත් බවට සහතිකයක්ද කළ යුතුය. චෝදනා පත්‍ර කෙටුම්පත් සමග, සහතික කරන ලද මූලික විමර්ශන සටහන්වල සහ වාර්තාවේ පිටපතක් ද, වෙනත් අදාළ ලියකියවිලි ද, <u>අත්‍යාවශ්‍යයෙන්ම</u> රහසිගත තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය.

3:3. නිලධාරියෙකුගේ වැඩ තහනම් කළ අවස්ථාවකදී, චෝදනා පත්‍ර කෙටුම්පත <u>එක් මාසයක් ඇතුළත</u> රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. පිළිගත හැකි හේතු නොමැතිව චෝදනා පත්‍ර නිකුත් කිරීම ප්‍රමාද කිරීම දැඩි අකපසු කිරීමක් ලෙස සලකනු ලැබේ.

3:4. චූදිත නිලධාරියෙකු චෝදනාවලට තමා නිවැරදිකරු යයි පවසමින් තමාගේ නිර්දෝශීභාවය තහවුරු කිරීම සඳහා විධිවත් පරීක්ෂණයක් ඉල්ලා සිටින අවස්ථාවලදී ඒ කරුණු කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනවිට අමාත්‍යංශ ලේකම් පහත සඳහන් තොරතුරුද කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

(I) පැමිණිලි පක්ෂය වෙනුවෙන් කරුණු ඉදිරිපත් කරන නිලධාරියාගේ නම, තනතුර, ලිපිනය සහ දුරකථන අංකය.

(II) චෝදනා පත්‍රයේ සඳහන් ලිපිලේඛන තබා ඇත්තේ කාවුරුන් ළඟද යන වග.

(III) පරීක්ෂණය පැවැත්විය යුතු ස්ථානය සහ

(Iv) චූදිත නිලධාරියා කැමැත්ත දක්වන්නේ කවර මණ්ඩලයකින් පරීක්ෂණ නිලධාරීන් පත් කරනු ලැබීමට ද යන වග.

/ 4...

3:5. පැමිණිලි පක්ෂය වෙනුවෙන් කරුණු ඉදිරිපත් කිරීම සඳහා නිලධාරියෙකු පත්කළ යුත්තේ අදාළ අමාත්‍යංශයේ ලේකම් විසින් වන අතර, චූදිත නිලධාරියා වෙනුවෙන් පෙනී සිටීමට නියෝජිතයකුට අවසර දෙනු ලබන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසිනි.

3:6. සේවයේ නියුතු නිලධාරීන්ට අමතරව, පහත සඳහන් විනය පරීක්ෂණ මූල මණ්ඩල රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වා ගෙන යනු ලැබේ.

(I) විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන්ගේ මණ්ඩලය.
(II) විශ්‍රාමික අධිකරණ නිලධාරීන්ගේ මණ්ඩලය.
(III) විශ්‍රාමික නීති නිලධාරීන්ගේ මණ්ඩලය.
(Iv) අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද ඇති නීතිඥයින්ගේ මණ්ඩලය.

3:7. තම පරීක්ෂණ නිලධාරියා නිකම් පරීක්ෂණ මූල මණ්ඩලයකින් බලාපොරොත්තු වන්නේ දැ'යි චූදිත නිලධාරියා දන්වා තිබීමෙන් පසුව, විනය පරීක්ෂණ පැවැත්වීම සඳහා කොමිෂන් සභාව වෙත මූල මණ්ඩල කතරෙන් හෝ සේවයේ නියුතු රාජ්‍ය නිලධාරීන් අතුරින් පරීක්ෂණ නිලධාරීන් පත් කරයි.

3:8. විධිමත් විනය පරීක්ෂණයේ වාර්තාව ලද පසු එය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමේදී අදාළ අමාත්‍යංශයේ ලේකම් විසින් චෝදනා පත්‍රයේ සඳහන් එකිනෙක චෝදනා සම්බන්ධයෙන් පරීක්ෂණ නිලධාරියාගේ නිගමන පිළිබඳව තමාගේ නිරීක්ෂණයත් විනය නියෝගය පිළිබඳ තම නිර්දේශයත් සඳහන් කළ යුතුය. තවද ඔහු විසින් මේ සමග ඇති <u>"බී" ආකෘති පත්‍රයේ</u> අවශ්‍ය විස්තර තම පෞද්ගලික අත්සනින් සැපයිය යුතුය. විධිමත් විනය පරීක්ෂණයන්ට සම්බන්ධ සියලු ලියකියවිලි ද <u>අත්‍යවශ්‍යයෙන්ම</u> රහසිගත තැපෑලෙන් එවිය යුතුය. අදාළ අමාත්‍යංශයේ ලේකම්ගේ නිරීක්ෂණ සමග විනය පරීක්ෂණ වාර්තාව ලැබුණු විට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විනය නියෝගය නිකුත් කරනු ඇත.

3:9. පරීක්ෂණ නිලධාරීන්ට ගෙවීම් කිරීමේදී දීර්ඝ කාලයක් ප්‍රමාදවීම් සිදුවන අවස්ථා කොමිෂන් සභාවේ අවධානයට යොමු කරනු ලැබ ඇත. පරීක්ෂණ නිලධාරීන්ට සිය ගෙවීම් අප්‍රමාදව කළයුතු බවටත්, අනවශ්‍ය ලෙස ගෙවීම් ප්‍රමාද වන බවට පැමිණිලි කිරීමට ඉඩ නොතැබීමටත්, වග බලා ගැනීම අදාළ අමාත්‍යංශයේ ලේකම්වරයාගේ වගකීම වන්නේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අණපරිදි,

සි. හතරසිංහ
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව